කොළඹ දිසා අධිකරණයේදීය.

කොළඹ ලෝටස් පාරේ, අංක.55, කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ, හොටෙල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම පිළිබඳව වන කාරණය සම්බන්ධයෙන් ,

නඩු අංක : 217/සීඕ

සහ

1982 අංක.18 දරණ සමාගම් පනතේ IX කොටස යටතේ අධිකරණය විසින් ඈවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව වන කාරණය සම්බන්ධයෙන් ,

නිහාල් ශ්‍රී අමරසේකර,

අංක.167/4,විපුලසේන මාවත,

කොළඹ 10.

පෙත්සම්කරු.

13 MAY 2009

කොළඹ-12

කොළඹ දිසා අධිකරණ අංක 01 දිය.

දිසා විනිසුරු සම්පත් විජේරත්න මැතිතුමා ඉදිරිපිටදිය.

සටහන් කිරීම : ආර්.ඒ.හංසිකා විසිනි.

නඩු අංකය :217/CO

දිනය : 2009.05.07

නියෝගයः

පෙත්සම්කරු විසින් 1982 අංක 18 දරණ සමාගම් පනතේ IX කොටස යටතේ කොළඹ ලෝටස් පාරේ අංක 55 කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ, හොටෙල් ඩිවලර්පර්ස් (ලංකා ලිමිටඩ්) ඈවර කිරීම සඳහා 2006 නොවැම්බර් 17 වන දින දරන පෙත්සම මගින් මෙම ඉල්ලීම අධිකරණයට ඉදිරිපත් කර ඈත.

සමාගමේ කොටස් හිමියකු වශයෙන් පෙත්සම්කරු සමාගම ඈවර කිරීමට ඉල්ලා සිටින්නේ සමාගමේ ණය ගෙවීමට එයට නොහැකි වී ඈතිය යන පදනම සහ සමාගම ගණන් බේරා වසා දැමීම සාධාරණ සහ යුක්ති සහගතය යන පදනම මතය. ඒ බව පෙත්සම්කරු වෙනුවෙන් මෙම නඩුව සඳහා ඉදිරිපත් කරන ලද 2009 මාර්තු 06 වන දින දරණ ලිඛිත දේශනයේ සඳහන් කර ඈත. ඒ අනුව මෙම ඉල්ලීම පනතේ 256(ඇ) වගන්තිය සමඟ කියවිය යුතු පනතේ 255 (ඉ) සහ (ඊ) වගන්තිය යටතේ වන ඉල්ලීමක් වශයෙන් පෙත්සම්කරු සඳහන් කරයි. සමාගම් පනත යටතේ බලපැවැත්වෙන 1939 - සමාගම් ඈවර කිරීම සම්බන්ධ රීති වල 7 (1) රීතියට අනුව සෑම පෙත්සමක්ම විමසීමට දින 7 කට පෙර එක්වරක් රජයේ ගැසට් පත්‍රයේ තවත් එක් වරක් ශ්‍රී ලංකාවේ පලකරනු ලබන දින පතා ඉංග්‍රීසි පුවත් පතකද ප්‍රසිද්ධ කළයුතුව ඈත. එහිම 8 වන රීතිය යටතේ එවැනි පෙත්සමක් ඈවර කිරීමට ඉල්ලා සිටින සමාගමේ ලියාපදිංචි කාර්යාලය වෙත බාරදිය යුතුව ඈත. 2006 නොවැම්බර් 23 වන දින හා අංක 2 කාර්ය සටහනට අනුව ඉහත පියවර ගැනීම සඳහා අධිකරණය නියෝගය කර ඈත. ඒ අනුව ප්‍රසිද්ධ කරන ලද 2006 නොවැම්බර් 27 දින දරණ පුවත් පත් දැන්වීම සහ 2006 දෙසැම්බර් 08 දින හා අංක 1, 475 දරණ ගැසට් නිවේදනය නඩු වාර්තාවට ගොනු කර ඈත.

13 MAY 2009

ඉන් අනතුරුව 9 වන රීතිය යටතේ පෙත්සම්කරු වෙනුවෙන් ඉදිරිපත් කලයුතු දිවුරුම් ප්‍රකාශය , 2006 දෙසැම්බර් 13 වන දින හා අංක 4 කාර්ය සටහන යටතේ ඉදිරිපත් කල බව සටහන් වී ඇත. එම දිවුරුම් ප්‍රකාශයේ දිනය 2006 නොවැම්බර් 18 වන දිනය වන අතර එහි සඳහන් අධිකරණයේ මුද්‍රාව 2006 නොවැම්බර් 20 දිනය දරයි. ඒ අනුව එය 2006 නොවැම්බර් 20 වන දින අධිකරණයට ඉදිරිපත් කර ඇති බව පෙනී යයි. පෙත්සම ඉදිරිපත් කර ඇත්තේ 2006.නොවැම්බර් 17 වන දින දීය. එබැවින් දිවුරුම් පෙත්සම 9 වන රීතියට අනුකූලව පෙත්සම ඉදිරිපත් වූ දින සිට දින 4 ක් ඇතුලත ඉදිරිපත් කර ඇතැයි සැලීමට පත් විය හැකිය.

2006 දෙසැම්බර් 08 දින එම දිනම දරණ දිවුරුම් ප්‍රකාශයක් මගින් මොහොමඩ් නවාස් රාජාබ්ඩීන් නැමැත්තෙකු පෙත්සම්කරුගේ ඉල්ලීමට විරෝධතා ඉදිරිපත් කර ඇත. දිවුරුම් පෙත්සමේ 25 වන ජේදයේ සඳහන් කරන්නේ පෙත්සම්කරු 1983 මාර්තු සිට 1990 දෙසැම්බර් දක්වා සහ 1994 ඔක්තෝබර් සිට 2005 නොවැම්බර් දක්වා සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්ද, 2004 ජූලි සිට 2005 නොවැම්බර් දක්වා සමාගමේ සභාපති ලෙසද සිටි බවයි. පෙත්සමේ 18 සහ 30 ජේදවල සඳහන් කරුණු අනුව අධිකරණයට ඒත්තු ගත හැක්කේ ප්‍රකාශක ඇවර කිරීමට යෝජිත සමාගම වෙනුවෙන් විරෝධතා දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇති බවයි. ඊට අමතරව 2007 මැයි 10 දින දරණ පෙත්සම සහ 2007 මැයි 09 දින දරණ දිවුරුම් පෙත්සම් මගින් ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් මෙම නඩුවට මැදිහත් වූ නීති පති තුමා විසින් පෙත්සම්කරුගේ ඉල්ලීමට විරෝධතා ඉදිරිපත් කර ඇත. තවද කෝනල් ලයනල් පෙරේරා නැමැත්තෙකු විසින් 2007 මැයි 17 දින දරණ මැයි 18 දින අධිකරණයට ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මගින් පෙත්සම්කරුගේ ඉල්ලීමට විරෝධතා ඉදිරිපත් කර ඇත. 2007 මැයි 17 දින දරණ දිවුරුම් ප්‍රකාශ දෙකක් මගින් සීමාසහිත මිට්සුයි සහ සමාගම වෙනුවෙන් ටොෂිකාෂු ඉනෝයු සහ ටායිසෙයි කෝපරේෂන් වෙනුවෙන් යසුජි නකසාටෝ විසින් පෙත්සම්කරුගේ ඉල්ලීමට විරෝධතා ඉදිරිපත් කර ඇත.

ඉහත රීති වල 15 වන රීතියේ පෙත්සම්කරුගේ ඉල්ලීමට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශ සහ ඊට පිලිතුරු වශයෙන් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශ වලට අදාල විධිවිධාන සඳහන් වේ. 15 (1) රීතියට අනුව 9 වන රීතියේ සඳහන් පෙත්සම තහවුරු කරන දිවුරුම් ප්‍රකාශය ගොනු කල දින සිට දින 7 ක් තුළ පෙත්සම්කරුගේ ඉල්ලීමට

13 MAY 2009

විරෝධතා ඇත්නම් ඒ සඳහා වන දිවුරුම් ප්‍රකාශය පෙත්සම්කරුට හෝ ඔහුගේ නීතීඥ වරයාට දැන්වීම් සහිතව ඉදිරිපත් කළයුතුව ඇත.

15 (2) රීතිය අනුව එසේ ඉදිරිපත් කරනු ලබන විරෝධතා දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු දිවුරුම් ප්‍රකාශයක් විරෝධතාව සම්බන්ධව දැන්වීමක් පෙත්සම්කරුට හෝ පෙත්සම්කරුගේ නීතීඥවරයාට ලැබුණු දින සිට දින 3 ක් ඇතුලත ගොනු කළයුතුව ඇත.

ඉහත කරුණු සළකා බැලීමේදී අධිකරණයට පෙනී යන්නේ පෙත්සම්කරුගේ ඉල්ලීමට ඉදිරිපත් කර ඇති විරෝධතා දිවුරුම්ප්‍රකාශ කිසිවක් 15 (1) රීතියට අනුකූලව දින 7 ක කාලයක් තුල ඉදිරිපත් කර නැති බවයි. ඒ සම්බන්ධයෙන් මිට්සුයි සහ සමාගම සහ ටායිසෙයි කෝපරේෂන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයේ සඳහන් කර ඇත්තේ විරෝධතා දිවුරුම් ප්‍රකාශය ප්‍රමාද වී ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර නැති නිසා විරෝධය පෑම අත්හරින ලද ලෙසට සැලකිය යුතුව ඇති බවයි. එසේ කියා සිටින තැනැත්තන්ම පසුව පෙත්සම්කරුගේ පිළිතුරු දිවුරුම් ප්‍රකාශය 15 (2) රීතියට අනුකූලව ඉදිරිපත් කර නැති බවට විරෝධතාවයක් නගා ඇත.

පෙත්සම්කරු විසින් 15 (2) රීතිය යටතේ පිළිතුරු දිවුරුම්ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ 2006 දෙසැම්බර් 19 දිනදීය. ඒ ඉදිරිපත් කර ඇත්තේ 2006 දෙසැම්බර් 08 දින සමාගම වෙනුවෙන් මොහොමඩ් නවාස් රාජාබ්ඩීන් විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු වශයෙනි. මා ඉහත සඳහන් කල පරිදි ඉන් පසුවද ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන්ද කෝනල් ලයනල් පෙරේරා නැමැත්තෙකුද වෙනුවෙන්ද සීමාසහිත මිට්සුයි සහ සමාගම වෙනුවෙන්ද, ටායිසෙයි කෝපරේෂන් වෙනුවෙන්ද විරෝධතා දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. ඒවාද 15 (1) රීතියට අනුකූලව ඉදිරිපත් වී නැති නිසා පිළිතුරු දිවුරුම් ප්‍රකාශ සම්බන්ධයෙන් පමණක් 15 (2) රීතිය තරයේ අනුගමනය කරනු ලැබුවහොත් ඒවාට පිළිතුරු දීමේ අවස්ථාව පෙත්සම්කරුට අහිමි වේ.

පෙත්සම්කරු විසින් 2007 ජූලි 30 වන දින අතිරේක පිළිතුරු දිවුරුම් ප්‍රකාශයක්ද 2007 ඔක්තෝබර් 04 වන දින වැඩිදුර අතිරේක පිළිතුරු දිවුරුම් ප්‍රකාශයක් ද අධිකරණයට ඉදිරිපත් කර ඇත.

13 MAY 2009

2008 සැප්තැම්බර් 25 දින සටහන් සළකා බැලීමේදී පෙත්සම්කරුට ඉහත සඳහන් අතිරේක දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට නීතියෙන් ඉඩක් නොමැති බවට පෙත්සම්කරුගේ ඉල්ලීමට විරෝධතා ඉදිරිපත් කර ඇති පාර්ශවකරුවන් කරුණු දක්වා ඇති අතර පෙත්සම්කරු වෙනුවෙන් පෙත්සම්කරුගේ ඉල්ලීමට ඉදිරිපත් කර ඇති විරෝධතා නීත්‍යානුකූල නොවන බවට කරුණු ඉදිරිපත් කර ඇත. දෙපක්ෂයම ඒ සම්බන්ධයෙන් ලිඛිත දේශන ඉදිරිපත් කර නියෝගයක් ලබාගැනීමට එකග වී ඇති අතර මෙම නියෝගය අදාල වන්නේ ඉහත කාරණා සම්බන්ධයෙනි.

ප්‍රථමයෙන්ම පෙත්සම්කරු විසින් 15 (2) රීතිය යටතේ 2006 දෙසැම්බර් 19 දින ඉදිරිපත් කර ඇති පිළිතුරු දිවුරුම් ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කිරීමේදී ඒ සම්බන්ධ විරෝධතාවය වන්නේ එය 15 (2) රීතියට අනුකූලව දින 3 ක් තුළ ඉදිරිපත් කර නැති බවයි. ඈවර කිරීමට යෝජිත සමාගම වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ 2006 දෙසැම්බර් 08 දින දීය. ඊට අදාල දැන්වීම පෙත්සම්කරුගේ ලේඛන ගත නීතිඥවරයා වෙත යවන ලද බව තහවුරු කිරීම සඳහා වන ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය ඇලවූ මෝෂම 2006 දෙසැම්බර් 08 දිනදී අධිකරණයට ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධව ඈවර කිරීමට යෝජිත සාමගම වෙනුවෙන් දරනු ලබන ස්ථාවරය වන්නේ එය අවම වශයෙන් දෙසැම්බර් 14 වන දිනවත් පෙත්සම්කරුගේ ලේඛන ගත නීතිඥවරු වෙත ළගාවිය යුතුව ඇති බවයි. තීරණය වූ නඩුවක් වන **පොඩිසිඤ්ඤෝ එරෙහිව පෙරේරා 75 න.නි.වා. 333 නඩුවේ** සඳහන් වී ඇති ආකාරයට ලිපියක් නියමිත ලිපිනය සඳහන් කර තැපැල් කර ඇති බව ඔප්පු කළවිට එය ඉදිරියේදී ලිපිහිමියා වෙතට ළගාවූ බවට පූර්ව නිගමනයක් ඇති වේ. මෙම නඩුවට අදාළව නම් මෝසමට අලවා ඇති ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සියේ පෙත්සම්කරුවන්ගේ ලේඛනගත නීතිඥවරයාගේ ලිපිනය වශයෙන් පෙරකලාසියේ සඳහන් ලිපිනය නිවැරදිව සටහන් කර ඇත. ඒ අනුව එය තැපැල් කිරීමෙන් පසුව ලිපිහිමියා වෙත ළගාවූ බවට පූර්ව නිගමනයක් ඇති කරගත හැකිය. නමුත් එය ලිපිය නියමිත දිනකදී ලිපිහිමියා වෙත ළගාවූ බවට පූර්ව නිගමනයක් ජනිත නොකරයි. පෙත්සම්කරුද ලිපිය ලැබීම ප්‍රතික්ෂේප නොකරයි. එය 2007 දෙසැම්බර් 16 වන සෙනසුරාදා දින කාර්යාලය වසා තිබියදී එහි භාරකරු වෙත භාර දෙනු ලදුව 2006 දෙසැම්බර් 18 වන සඳුදා කාර්යාලය විවෘත කල විට ලේඛන ගත නීතිඥවරයාට ලැබුණ

13 MAY 2009

බව ප්‍රකාශ කරයි. ඊට එරෙහිව ලිපිය දෙසැම්බර් 14 දින හෝ ඊට පෙර ලද බවට වන විරුද්ධ පාර්ශවයේ ස්ථාවරය තහවුරු කිරීමට සාක්ෂි කිසිවක් ඉදිරිපත් කර නැත. ඒ සඳහා සාක්ෂි ආඥා පනතේ 114 (ඉ) වගන්තිය යටතේ වන නිලකටයුතු නිසිලෙස ඉටු වී ඇති බවට වන පූර්ව නිගමනය මත පමණක් විශ්වාසය තැබීම ප්‍රමාණවත් නොවන බව ඉහත සඳහන් නඩු තීන්දුවෙන්ම පැහැදිලි වේ.

15(2) රීතිය යටතේ පිළිතුරු දිවුරුම් ප්‍රකාශය 2006 දෙසැම්බර් 19 දින ඉදිරිපත් කර ඇති බැවින් එය ඉහත රීතියට අනුකූල බවට මම තීරණය කරමි.

මී ලඟට 2007 ජූලි 30 දින දරණ අතිරේක පිළිතුරු දිවුරුම් ප්‍රකාශය සහ 2007 ඔක්තෝබර් 4 දින දරණ වැඩිදුර අතිරේක දිවුරුම් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමුකිරීමේදී මා ඉහත සඳහන් කළ පරිදි 15 (1) රීතියට පටහැනිව විරෝධතා දිවුරුම් ප්‍රකාශද ඉදිරිපත් කර ඇති නිසා හුදෙක් පෙත්සම්කරු ඊට විරුද්ධ නොවූ පමණින් ඒවා බාර ගෙන පෙත්සම්කරුගේ පිළිතුරු දිවුරුම් ප්‍රකාශයට පමණක් 15(2) රීතිය තරයේ අදාළ කර ගැනීම සාධාරණ සහ යුක්ති සහගත වන්නේ නැත.

1939 සමාගම් ඇවර කිරීමට අදාල රීතිවල 9, 15 (1) සහ 15(2) වගන්ති වල සඳහන් කාලසීමා සඳහන් කර ඇත්තේ " කලයුතුය" (Shall be) වශයෙනි. ඒ අනුව බැලු බැල්මට පෙනී යන්නේ එය අනිවාර්ය විධිවිධානයක් බවයි. නමුත් "Shall" යන වචනයේ අර්ථ නිරූපනය සම්බන්ධයෙන් ඉන්දියානු ලේඛක එන්.එස්. බින්ද්‍රා විසින් රචිත Interpretation of Statutes නම් ග්‍රන්ථයේ 8 වන වෙලුමේ 596 සහ 1029 පිටුවල ඇති සඳහන් කෙරෙහි අවධානය යොමු කිරීමේදී අධිකරණයට ඒත්තු යන්නේ ඉහත Shall යන වචනයෙන් හැමවිටම "කලයුතුය" යන්න අදහස් නොවන බවත් එය සමස්ථ පනත සැලකිල්ලට ගෙන තීරණය කලයුතු බවත්ය. එහි මෙසේ සඳහන් වේ.

**Shall** – The word 'shall in its ordinary signification is mandatory though there may be considerations which influence the Court in holding that the intention of the Legislature was to give a discretion. But this word is not necessarily mandatory, nor always mandatory. Whether the matter

13 MAY 2009

is mandatory or directory only depends upon the real intention of the Legislature which is ascertained by carefully attending to the whole scope of the statute to be construed.

සමාගම් පනත යටතේ වන රෙගුලාසි සළකා බැලීමේදී නියම කර ඇති කාලසීමා ඉතාම කෙටි බව අධිකරණයට පෙනී යයි. ඉන් සමාගමක් ඈවර කිරීමේ ක්‍රියා පටිපාටිය ඉක්මන් කිරීමක් විනා එසේ ඉක්මන් කිරීම තුලින් යුක්තිය ඉෂ්ට වීමට බාධා පැමිණවීමක් බලාපොරොත්තු වී ඇති බව සමස්ථ කාර්ය පටිපාටිය සළකා බැලීමේදී අධිකරණයට එත්තු යන්නේ නැත.

තීරණය වූ නඩුවක් වන COLOMBO ENGINEERING ENTERPRISES (PVT) LTD.AND OTHERS VS HATTON NATIONAL BANK LTD. 1999 (1) ශ්‍රී.ල.නි.වා. 72 නඩු තීන්දුවේ 1982 අංක 17 දරණ සමාගම් පනතේ 15 (1) සහ 15 (2) රීති සළකා බලා තීරණය කර ඇත්තේ සමාගමක් ඈවර කිරීම සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශ සහ ලිඛිත දේශන මත පමණක් තීරණය කලයුතුව නැති බවත් අවශ්‍ය අවස්ථාවලදී සාක්ෂි සම්බන්ධ සාමාන්‍ය රීති අනුගමනය කරමින් වාචික සාක්ෂි කැඳවීමට පවා හැකි බවත්ය. එම තීන්දුවේ A B C Coupler and Engineering Co. Ltd 1862 ALL ER 68 නැමැති ඉංග්‍රීසි නඩු තීන්දුවේ Buckley විනිසුරු තුමාගේ ප්‍රකාශයක් උපුටා දක්වා ඇත්තේ මෙසේය. " Where the learned Judge decided that **where grave charges were leveled against individuals the court would not in the exercise of its discretionary jurisdiction be satisfied with prima facie evidence but require the petitioner to substantiate his case more fully.** that in such cases it would require where practicable the evidence of witnesses with direct knowledge of the matters to which they were testifying and on which they could be cross – examined and which conformed to the ordinary rules of admissibility"

තවදුරටත් එම තීන්දුවවේ මෙසේද සඳහන් වේ.

**"Whilst no doubt the verifying affidavit is always a necessary document, in all cases it may not always be sufficient to verify the the petition. In sush cases the Judge clearly has a discretion to allow the testimony of witnesses and their cross- examination. It may appear to**

13 MAY 2009

**be contradictory to the statutory provisions which provide that affidavits should in ordinary circumstances be sufficient prima facie evidence of the statements of the petition, but where the verifying affidavit is not sufficient , then and only then must opportunity be afforded for the adducing of evidence and/ or cross- examination** of the deponent witnesses."

Whilst expeditious procedure was no doubt intended by the legislature, courts must also be conscious that the winding-up of a company is a drastic remedy which may have far-reaching consequences, financial, and commercial and also consequences not only affecting the company but also those concerned with it. And the courts should act only after having a careful consideration of the statuting affidavits and where they are insufficient material matters allow viva voce evidence.

- ඉහත සදහන් කරුණු අනුව වාචික සාක්ෂි කැඳවීමට දෙපක්ෂයෙන්ම ඉල්ලීමක් ඉදිරිපත් වී නැති නිසා ඒ වෙනුවට නඩුවට සම්බන්ධ වැඩිදුර කරුණු හෙළිදරවු කිරීම සදහා ඉදිරිපත් කර ඇති පෙත්සම්කරුගේ 2007 ජූලි 30 සහ 2007 ඔක්තෝබර් 04 දින දරණ දිවුරුම් ප්‍රකාශ යුක්තිය සහ සාධාරණත්වය ඉෂ්ඨ කිරීම සදහා අවශ්‍ය යයි ද ඉන් විරුද්ධ පාර්ශවයට අගතියක් සිදුවිය නොහැකියයි සළකා භාරගැනීමට තීරණය කරමි.

මී ලගට පෙත්සම්කරු විසින් ඈවර කිරීමට යෝජිත සමාගම වෙනුවෙන් මොහොමඩ් නවාස් රාජාබ්ඩීන් නැමැත්තා විසින් ගොනු කර ඇති දිවුරුම් ප්‍රකාශයට එරෙහිව ඉදිරිපත් කරන ලද විරෝධතා කෙරෙහි අවධානය යොමු කිරීමේදී එහි ප්‍රකාශක සමාගමේ නිලයක් දරා ඇත්තේ 2005 නොවැම්බර් මාසය දක්වා පමණක් බව 25 ජේදයේ සදහන් කරුනු වලින් ඒත්තු යයි. ඒ හැර ප්‍රකාශක දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන දිනය වන විට සමාගමේ දරණ තත්ත්වය එහි සදහන් නොවේ. සමාගම් පනතේ ඈවර කිරීමේ රීති 172 සමග කියවෙන සිවිල් නඩු විධාන සංග්‍රහයේ 183 අ (ආ) වගන්තියට අනුව සමාගමක් වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශයක් සහතික කල හැක්කේ එහි ලේකම්, අධ්‍යක්ෂක හෝ වෙනත් ප්‍රධාන නිලධරයකු විසිනි. ප්‍රකාශකගේ තත්ත්වය දිවුරුම් ප්‍රකාශයේ සදහන් නොකිරීම දෝෂයකි. නමුත් මෙම නඩුව සදහා ඈවර කිරීමට යෝජිත සමාගම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති පෙරකලාසියේ අත්සන සහ දිවුරුම් ප්‍රකාශයේ අත්සන

13 MAY 2009

බැලූ බැල්මට සමානය. නමුත් එම අත්සන දරන්නාගේ තත්ත්වය පෙන්නුම් කරන මුද්‍රාව පෙරකාලසියේ ඉරී ගොස් ඇත. එබැවින් නිසි කරුණු විමර්ශනයකින් තොරව තාක්ෂණික හේතුවක් මත දිවුරුම් ප්‍රකාශය ප්‍රතික්ෂේප කිරීම මා ඉහත මෙම නියෝගයේ උපුටා දක්වන ලද බව නඩු තීන්දුවට අනුව උචිත නොවන බවට තිරණය කරමි. ඒ සම්බන්ධයෙන් විමසීම අවස්ථාවේදී සළකා බැලීමට තිරණය කරමි.

කෙසේ වෙතත් ප්‍රකාශකගේ දිවුරුම් ප්‍රකාශයේ 30 ජේදයේ තම පුද්ගලික දැනුමෙන් හා ලියකියවිලි කියවා බැලීමෙන් ප්‍රකාශය කරන බව සදහන් කර ඇති නිසා 183 අ වගන්තියේ අතුරු විධානයේ සදහන් විධිවිධාන ප්‍රකාශක විසින් පිළිපැද ඇති බවට සෑහීමට පත් වෙමි.

සිමාසහිත කෝනල් සහ සමාගම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ මෙම නඩුවට, සමාගම් ඇවර කිරීමේ රීති වල 172 රීතිය යටතේ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 91 අ වගන්තියේ සදහන් කල් ලබාදීමට අදාල විධිවිධාන අදාල කරගත යුතු බවට සදහන් කර ඇතත් ඉහත රීති වල 9, 15 (1) හා 15 (2) රීතීන් හි නියමිත කාල සීමා පැහැදිලිව දක්වා ඇති බැවින් 172 රීතිය යටතේ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධි විධාන අදාළ කරගැනීමට හැකියාවක් නැත. මන්ද යත් එවැනි විධි විධාන අදාළ කර ගත හැක්කේ රීති වල විධිවිධාන සළස්වා නැති අවස්ථා වලදී පමණක් බැවිනි.

මාවිසින් ඉහත දක්වන ලද සියළු හේතු මත පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර ඇති 2006 දෙසැම්බර් 19 දින දරණ පිළිතුරු දිවුරුම් ප්‍රකාශය , 2007 ජූලි 30 දින දරණ අතිරේක පිළිතුරු දිවුරුම් ප්‍රකාශය සහ 2007 ඔක්තෝබර් 04 දින දරණ වැඩිදුර අතිරේක පිළිතුරු දිවුරුම් ප්‍රකාශය භාර ගනිමි.

සම්පත් විජේරත්න

දිසා විනිසුරු

2009.05.07

ඉහත පිටු අංක 01 සිට 08 දක්වා සඳහන් වන්නේ කොළඹ දිසා අධිකරණ නඩු අංක 217/CO දරන නඩුවේ 2009.05.07 දිනැති නියෝගයේ සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

[illegible] : [illegible] (ගාංජිකා) Q/ 870793